A3-4 A4-1

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පත්‍රය - I<br>வணிகமும் கணக்கீட்டுக் கல்வியும்வினாத்தாள் - I<br>Business & Accounting Studies Paper - I | පැය එකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>one Hours |

සැලකිය යුතුයි:

i. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.

iii. ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරට අදාළ අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

iv. එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරෙස්සමෙන් කියවන්න.

01. මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටුකරන ඕනෑම කටයුත්තක් ව්‍යාපාර ලෙස හැඳින්වේ. වුවමනා බිහි කරන්නේ ව්‍යාපාරිකයන් ය. ඒ අනුව අවශ්‍යතාවයක මූලික ලක්ෂණයක් වන්නේ,
1. සංකීර්ණ වීම හා විවිධ වීම.
2. ව්‍යාපාරිකයන්ගේ නිර්මාණ වීම.
3. සෑම මිනිසුන්ටම පොදු වීම.
4. අසීමිත වීම හා තෘප්තිමත් නොවීම.

02. ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි මූලික අරමුණ වන්නේ,
1. ලාභ ඉපයීමයි.
2. භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවයයි.
3. රැකියා උත්පාදනයයි.
4. සේවක සුභ සාධනයයි.

03. ඕනෑම ව්‍යාපාරයක සාර්ථකත්වය රඳා පවතින්නේ,
1. නිෂ්පාදනය මතයි.
2. පාරිභෝගික සම්බන්ධතාව මතයි.
3. නිෂ්පාදනය හා බෙදා හැරීම මතයි.
4. අයිතිකරුවන් හා සේවකයින් මතයි.

04. භාණ්ඩ හා සේවා අතර වෙනස හඳුනාගත හැක්කේ,
1. මිල මත ය.
2. ඉල්ලුම මත ය.
3. සැපයුම මත ය.
4. ස්පර්ශ කළ හැකි බව මත ය.

05. මිනිස් අවශ්‍යතා ඉටු කරන වුවමනා වල දැකිය හැකි ලක්ෂණයක් නොවන්නේ,
1. අත්‍යාවශ්‍ය නොවීම.
2. විවිධ වීම.
3. නිර්මාණය කළ නොහැකි වීම.
4. අසීමිත වීම.

06. පහත සඳහන් ඒවායින් නිෂ්පාදිතයක් ලෙස නොසැලකෙන්නේ,
1. කාලය යි.
2. භාණ්ඩ ය.
3. සේවා ය.
4. අදහස් ය.

07. භෞතික ආයතන නොමැතිව වර්තමානයේ ව්‍යාපාර කටයුතු කරගෙන යයි. මේ සඳහා යොදා ගනු ලබන ප්‍රධාන පහසුකම වන්නේ,
1. දුරකථනය
2. අන්තර්ජාලය
3. ෆැක්ස් යන්ත්‍රය
4. අදහස්ය

08.'අ' කොටස හා 'ආ' කොටස හා නිවැරදිව ගැළපූ විට නිවැරදිව ලැබෙන පිළිතුර තෝරන්න.

| | 'අ' | | 'ආ' |
|---|---|---|---|
| 1 | ආහාර | A | හෙද සේවය |
| 2 | ඇඳුම් පැළඳුම් | B | පාවහන් |
| 3 | නිවාස | C | කේක් |
| 4 | සෞඛ්‍ය පහසුකම් | D | පොත්පත් |
| 5 | අධ්‍යාපනය | E | තට්ටු නිවාස |

1. CBEAD
2. ABCED
3. ABCDE
4. CABDE

09.ව්‍යාපාරයක ව්‍යාපාර සැලසුම් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම හා නිවැරදි තීරණ ගැනීම කරනු ලබන්නේ,

1. අයිතිකරුවෝ ය.
2. සැපයුම්කරුවෝ ය.
3. කාර්යාල සේවකයින් ය.
4. කළමනාකරුවන් ය.

10.රජයේ පාසලට සම්බන්ධ ඇල්මැති පාර්ශවයක් නොවන්නේ,

1. ගුරුවරු ය.
2. සිසුන් ය.
3. කාර්යාල සේවකයෝ ය.
4. ආයෝජකයන් ය.

11. ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි පරිසරය වනුයේ,

1. අභ්‍යන්තර පරිසරය යි.
2. බාහිර පරිසරය යි.
3. සාර්ව පරිසරය යි.
4. ව්‍යාපාර පරිසරය යි.

12.බාහිර පරිසර සාධක පදනම් කරගෙන අධ්‍යනය කළ හැක්කේ,

1. අවස්ථා හා තර්ජන ය.
2. අවස්ථා හා ශක්තීන් ය.
3. ශක්තීන් හා දුර්වලතා ය.
4. තර්ජන හා දුර්වලතා ය.

13.අභ්‍යන්තර පරිසර සාධක පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. වැටුප් , සේවා නියුක්තිය , සේවකයෝ
2. අයිතිකරුවෝ , කළමනාකරුවෝ , සේවකයෝ
3. ගෝලීය පරිසරය , දේශපාලනික පරිසරය , කළමනාකරුවෝ
4. ගණුදෙණුකරුවෝ , අයිතිකරුවෝ , කළමනාකරුවෝ

14.දේශීය ව්‍යාපාරය සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන අහිතකර බලපෑමක් නොවන්නේ.

1. දැඩි තරඟකාරීත්වයකට මුහුණදීමට සිදුවීම.
2. දේශීය පුහුණු ශ්‍රමය විදේශීය රටවලට ඇදීයාම.
3. දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම.
4. නවීන තාක්ෂණය යොදා ගත හැකි වීම.

15.ආර්ථික පරිසර නියෝජනය කරන සාධකයක් නොවන්නේ,

1. පොළී අනුපාතය.
2. ආදායම් බෙදීයාම.
3. ජනගහනයේ වයස් ව්‍යුහය.
4. දළ ජාතික නිෂ්පාදිතය.

16.රජයක් ව්‍යාපාර වලට මැදිහත් වන්නේ,

1. ව්‍යාපාර ආරක්ෂා කර ගැනීමට.
2. සමාජය ආරක්ෂා කර ගැනීමට.
3. ව්‍යාපාරය හා සමාජය ආරක්ෂා කර ගැනීමට.
4. රජයට ආදායම් ලබා ගැනීමට.

17. ඒක පුද්ගල ව්‍යාපාර , ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අනිවාර්ය වාර්තාව වන්නේ,

1. පරිසර වාර්තාව ය.
2. ග්‍රාම නිලධාරී වාර්තාව ය.
3. දිවි නැගුම සංවර්ධන නිලධාරී වාර්තාව ය.
4. මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාව ය.

18. නෛතික පුද්ගලභාවයක් නොමැති ව්‍යාපාර සංවිධානයක් වන්නේ,

1. සීමිත පොදු සමාගම් ය.
2. සීමිත පෞද්ගලික සමාගම් ය.
3. රාජ්‍ය සංස්ථා ය.
4. හවුල් ව්‍යාපාරය.

19. තනි පුද්ගල ව්‍යාපාරයක් අදාළ පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ යුත්තේ,

1. ප්‍රාග්ධනය රු. 500,000 ට වැඩි වූ විට ය.
2. ව්‍යාපාරිකයාගේ නමින් හැර වෙනත් නමකින් ආරම්භ කරන විට ය.
3. ව්‍යාපාරයේ නමට මුලින් " සීමිත " යන පදය භාවිත කරන විට ය.
4. ව්‍යාපාර දෙකක එකම නම පවතින විට ය.

20. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ලෙස හඳුන්වන්නේ,

1. සේවක් සංඛ්‍යාව 25 ට අඩු ව්‍යාපාර.
2. සේවක සංඛ්‍යාව 15 ට අඩු ව්‍යාපාර.
3. සේවක සංඛ්‍යාව 40 ට අඩු ව්‍යාපාර.
4. සේවක සංඛ්‍යාව 20 ට අඩු ව්‍යාපාර.

21. ඕනෑම ව්‍යාපාර සංවිධානයකට පොදු වූ ලක්ෂණය තෝරන්න.

1. නීතිමය පුද්ගලභාවය.
2. සීමිත වගකීම්.
3. අඛණ්ඩ පැවැත්ම.
4. අරමුණු.

22. පද්මසිරි දිසානායක විසින් " පද්මසිරි ග්‍රොසරි " නමින් සිල්ලර වෙළඳසැලක් පවත්වාගෙන යයි. මෙම ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. මෙය හවුල් ව්‍යාපාරයකි.
2. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ.
3. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
4. මෙම ව්‍යාපාරයේ වගකීම සීමිත වෙයි.

23. ව්‍යාපාර සංවිධානයක් ලියාපදිංචි කිරීමෙන් අත්වන ප්‍රතිලාභය වන්නේ,

1. අඛණ්ඩ පැවැත්මක් ඇතිවීම.
2. ලාභ ඉපැයීමේ හැකියාව වැඩි වීම.
3. ණයෙන් නිදහස්වීම.
4. පිළිගැනීමක් ඇතිවීම.

24. අනිකුත් ව්‍යාපාර සංවිධානවලට සාපේක්ෂව විශාල ප්‍රාග්ධනයක් රැස්කරගත හැකි ව්‍යාපාර සංවිධානය වන්නේ,

1. තනි පුද්ගල ව්‍යාපාර.
2. හවුල් ව්‍යාපාර.
3. සමුපකාර.
4. සංස්ථාපිත සමාගම්.

The National e-learning Portal for the General Education

25.පෞද්ගලික අංශය සතු ලාභ අරමුණු කරගත් ව්‍යාපාර සංවිධාන වන්නේ,

1. සමුපකාර හා සමිති සංවිධාන
2. සංස්ථා හා දෙපාර්තමේන්තු
3. සංස්ථාපිත සමාගම් හා හවුල් ව්‍යාපාර
4. සමිති සමාගම් හා හවුල් ව්‍යාපාර

26.නීතිමය කටයුතු වලදී ආයතනයේ ප්‍රධානියා සිය නිල නාමයෙන් පෙනී සිටිය යුතු ව්‍යාපාර සංවිධාන වන්නේ,

1. සංස්ථා ය
2. තනි පුද්ගල ව්‍යාපාරය
3. දෙපාර්තමේන්තු ය
4. සමිති සමාගම් ය

27.ව්‍යාපාර සංවිධාන අරමුණු අනුව වර්ග කිරීමේදී ලාභ අරමුණු කර නොගත් පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානයක් වන්නේ,

1. පොදු සමාගම් ය
2. සමුපකාර සමිති ය
3. රාජ්‍ය සංස්ථා ය
4. හවුල් ව්‍යාපාර ය

28.රටකට රැකියා අපේක්ෂා කරන සියලු දෙනාටම ගැළපෙන රැකියාවක් ලැබේ නම් එය හඳුන්වනු ලබන්නේ ?

1. රැකියා නියුක්තිය යි.
2. රැකියා වියුක්තිය යි.
3. ඌණ සේවා නියුක්තිය යි.
4. පූර්ණ රැකියා නියුක්තිය යි.

29.ව්‍යාපාරයක සිදුවන ගණුදෙණු ඇතුළත් කළ යුතු නිවැරදි ගිණුම්කරණ සමීකරණය තෝරන්න.

1. වත්කම් = ප්‍රාග්ධනය + වගකීම්
2. ප්‍රාග්ධනය + හිමිකම් = වගකීම්
3. වත්කම් + ප්‍රාග්ධනය = වගකීම්
4. වත්කම් + වගකීම් = ප්‍රාග්ධනය

30.ව්‍යාපාරයක් රුපියල් 50,000.00 බැංකු ණයක් ලබාගතහොත් ඉන් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ ,

1. වත්කම් හර - හිමිකම් බැර
2. වත්කම් හර - වගකීම් බැර
3. වත්කම් හර - වගකීම් හර
4. වත්කම් හර - ප්‍රාග්ධනය බැර

31.වත්කම් හා වගකීම් අඩුවීමට බලපාන ගණුදෙණුවක් වන්නේ ,

1. ප්‍රාග්ධනය යෙදුවා රු. 100,000
2. උපකරණ මිලට ගත්තා රු. 25,000
3. රක්ෂණ ගාස්තු ගෙව්වා රු. 5,000
4. බැංකු ණය ගෙව්වා රු. 20,000

32. ව්‍යාපාරයක මූලික ගණුදෙණු හා ලෙජර් සටහන් යන දෙවර්ගයේම සටහන් තබනු ලබන පොතක් වනුයේ,

1. ගැණුම් පොත
2. මුදල් පොත
3. ලෙජර් පොත
4. විකුණුම් පොත

ව්‍යාපාරයක් සතුව පහත දැක්වෙන වත්කම් හා වගකීම් දැකිය හැකිය.

A. යන්ත්‍ර සූත්‍ර
B. ණය ගැතියෝ
C. පරිගණක
D. දිගු කාලීන බැංකු ණය
E. මුදල් ශේෂය
F. බැංකු අයිරාව
G. ගෙවිය යුතු ගෙවල් කුලී

මෙම තොරතුරු ආශ්‍රයෙන් අංක 33 සිට 36 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

33. ජංගම වත්කම් ලෙස සැලකිය හැකි නිවැරදි කාණ්ඩය වන්නේ,

1. B හා E   2. C හා F   3. A හා E   4. A හා C

34. ජංගම නොවන වත්කම් නියෝජනය වන්නේ,

1. A හා C   2. C හා E   3. B හා E   4. B හා F

35. D වලින් නියෝජනය වන්නේ,

1. ජංගම වත්කම්
2. ජංගම නොවන වත්කම්
3. ජංගම වගකීම්
4. ජංගම නොවන වගකීම්

36. G අක්ෂරයෙන් නියෝජනය වන්නේ,

1. ජංගම වගකීමකි
2. ජංගම වත්කමකි
3. ජංගම නොවන වගකීමකි
4. ජංගම නොවන වත්කමකි

37. ව්‍යාපාරයක් විසින් විදුලි වියදම් ගෙවීම රු 1000/- ගිණුම්කරණ සමීකරණයට ඇති කරන බලපෑම වන්නේ,

1. වත්කම් වැඩිවීම
   වියදම් වැඩිවීම
2. වත්කම් අඩුවීම
   වියදම් අඩුවීම
3. වගකීම් අඩුවීම
   වියදම් අඩුවීම
4. හිමිකම් අඩුවීම
   වත්කම් අඩුවීම

38. මුදල් පොත අනෙකුත් මූලික පොත් වලින් වෙනස් වන්නේ,

1. එය ද්විත්ව කාර්යයක් ඉටු කරන බැවිනි.
2. මුදලින් කරන ගණුදෙනු පමණක් සටහන් කරන බැවිනි.
3. එය අත්‍යාවශ්‍ය මූලික පොතක් වන බැවිනි.
4. ද්විත්ව සටහන් ක්‍රමය ක්‍රියාත්මක කරන බැවිනි.

39. මුදල් ගෙවීමේදී උපයෝගී කරගනු ලබන මූලාශ්‍ර ලේඛනය වන්නේ,

1. ලදු පත
2. ගැණුම් ඉන්වොයිසිය
3. විකුණුම් ඉන්වොයිසිය
4. වවුචරය

40. චෙක්පතක් බැංකුවේ තැන්පත් කළ විට අදාළ ද්විත්ව සටහන වන්නේ,

1. මුදල් ගිණුම හර
   බැංකු ගිණුම බැර
2. බැංකු ගිණුම හර
   මුදල් ගිණුම බැර
3. ගැණුම් ගිණුම හර
   බැංකු ගිණුම බැර
4. බැංකු ගිණුම හර
   ගැණුම් ගිණුම බැර

[සියලු ම හිමිකම් ඇවිරිණි]
[முழுப் பதிப்புரிமையுடையது]
[All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම - 2016
இரண்டாம் தவணைமதிப்பீடு - 2016
Second Term Evaluation - 2016

| | | |
|---|---|---|
| 10 ශ්‍රේණිය<br>தரம் 10<br>Grade 10 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය පත්‍රය - II<br>வணிகமும் கணக்கீட்டுக் கல்வியும்வினாத்தாள்- II<br>Business & Accounting Studies Paper - II | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலங்கள்<br>Two Hours |

සැලකිය යුතුයි:

- පළමු වන ප්‍රශ්නය ඇතුළුව I කොටසින් ප්‍රශ්න 02 ක් ද II කොටසින් ප්‍රශ්න 02 ක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01 අ.පො.ස උසස් පෙළ වාණිජ විෂය හාදාරා ඇති දමිත් බණ්ඩාර තම ඉතුරුම් වූ රු. 10,000 ක් හා තමා සතු ඉඩමේ ඔප්පුව ලංකා බැංකුවට උකස් කර රු.20,000 ක් ලබා ගත්තේය. රු.25,000 කට කුඩා වී අඹරන යන්ත්‍රයක් මිලදී ගෙන වී කෙටීමේ ව්‍යාපාරයක් අරඹන ලදී.

මීට අමතරව කුරක්කන් පිටි, උඳු පිටි, මිරිස් කුඩු, ගම්මිරිස් කුඩු යන දෑ දමිත් නිෂ්පාදන නමින් වෙළඳ පලට නිකුත් කරන ලදී. රු. 25,000 කට ගාමිණී සහ පුත්‍රයන් ගෙන් කුරක්කන් පිටි ණයට ගන්නා ලදී.

- ඉහත සිද්ධිය ඇසුරින් ප්‍රශ්න අංක (I) සිට ( x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. ඉහත සිද්ධිය අනුව දක්නට ලැබෙන ව්‍යාපාර සංවිධාන 02 ක් ලියා දක්වන්න.
ii. දමිත් නිෂ්පාදන ව්‍යාපාරය අයත් ව්‍යාපාර සංවිධාන වර්ගයේ වාසි 02 ක් හා අවාසි 02 ක් නම් කරන්න.
iii. දමිත් නිෂ්පාදන ව්‍යාපාර ලියාපදිංචි කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන 02 ක් ලියා දක්වන්න.
iv. ව්‍යාපාර කෙරෙහි රජය මැදිහත් වන ආකාර අනුව ව්‍යාපාර වලට විවිධ ලෙස බලපෑම් ඇතිවේ. මෙම ව්‍යාපාරයට එලෙස බලපාන්නට ඇතැයි සිතිය හැකි බලපෑම් 02 ක් ලියා දක්වන්න.
v. ඕනෑම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට විවිධ වූ සම්පත් අවශ්‍ය වේ. ඒවා නිෂ්පාදන සාධක ලෙස හඳුන්වයි. නිෂ්පාදන සාධක නම් කර ඒවාට උදාහරණ ද දක්වන්න.
vi. මෙම ව්‍යාපාරයේ සිදු වී ඇති ගණුදෙනු වල වත්කම්, වගකීම්, සඳහා උදාහරණ දක්වන්න.
vii. මෙම ව්‍යාපාරයට අදාළ ගිණුම්කරණ සමීකරණය ලියා දක්වන්න.
viii. මෙම සිද්ධියේ ඇති ගණුදෙනු එම ගිණුම්කරන සමීකරණයට ඇතුළත් කරන්න.
ix. මෙම සිද්ධියේ ගණුදෙනු දෙකක ද්විත්ව බලපෑම් 02 ක් ලියා දක්වන්න.
x. ගණුදෙනු දෙකක ද්විත්ව සටහන් ලියා දක්වන්න.

( ලකුණු 2 × 10 )

## I - කොටස - ව්‍යාපාර අධ්‍යනය

02. i. අවශ්‍යතා හා වුවමනා යන්න හඳුන්වා ඒවා නිදසුන් මගින් පැහැදිලි කරන්න.
ii. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාර 02 ක් හා සේවා ව්‍යාපාර 02 ක් සඳහා උදාහරණ දක්වන්න.
iii. අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැක. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? අදහස් දක්වන්න.
iv. ව්‍යාපාර වල අරමුණු ලියා දක්වන්න.
v. ඔබ දන්නා ආයතනයක් නම් කර එම ආයතනයට ඇල්මැති පාර්ශව නම් කරන්න.

( ලකුණු 2 × 5 )

03. i. ව්‍යාපාර පරිසර වර්ග කර ඇති ආකාරය ලියා දක්වන්න.

ii. ආර්ථික පරිසර බලපෑම් මගින් ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

iii. රාජ්‍ය දෙපාර්තමේන්තු වල වාසි 02 ක් දක්වන්න.

iv. ඔබ දන්නා රාජ්‍ය සංස්ථා 02 ක් ලියා දක්වන්න.

v. පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතන කීපයකි. මෙම ආයතන ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය ලියා දක්වන්න.

දුම්රිය දෙපාර්තමේන්තුව
ශාන්ත පුත්‍රයෝ
ශ්‍රී ලංකා විවිධ සේවා සමුපකාර සමිති
සීතා ස්ටෝර්ස්

(ලකුණු 2 × 5 )

04. i. පහත දැක්වෙන ශීර්ෂ යටතේ ඇති ව්‍යාපාර වර්ග අතර පවත්නා සමාන අසමානකම් දැක්වෙන වගුව සකස් කරන්න.

| ශීර්ෂය | තනි පුද්ගල | හවුල් ව්‍යාපාර | සී/ස සමාගම් | සමුපකාර |
|---|---|---|---|---|
| අයිතිය | | | | |
| කළමනාකරණය | | | | |
| වගකීම | | | | |
| නෛතික පුද්ගලභාවය | | | | |
| පැවැත්ම | | | | |

( ලකුණු 10 )

## II - කොටස - ගිණුම්කරණය

05. i. මල් ව්‍යාපාරයක් පවත්වා ගෙන යන පුෂ්පාගේ ව්‍යාපාරයේ පහත දැක්වෙන තොරතුරු ඔබට සපයා ඇත.

| | |
|---|---|
| දුරකථන ගාස්තු | ප්‍රාග්ධනය |
| උකස් ණය | ලද කොමිස් |
| බැංකු ණය | ණය හිමියෝ |
| විකුණුම් | යන්ත්‍ර සූත්‍ර |
| මෝටර් රථ අළුත්වැඩියා වියදම් | ණය ගැතියෝ |

අවශ්‍ය වන්නේ,

❖ ඉහත අයිතම වත්කම්, වගකීම්, හිමිකම්, ආදායම්, වියදම් යන ශීර්ෂ යටතේ වර්ග කර දක්වන්න.

( ලකුණු 05 )

ii. චාමරගේ ව්‍යාපාරයේ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

| වත්කම් | රු. | වගකීම් | රු. |
|---|---|---|---|
| ගොඩනැගිලි | 500,000 | ණය හිමියෝ | 40,000 |
| මුදල් | 175,000 | බැංකු ණය | 150,000 |
| තොගය | 200,000 | | |

❖ ඉහත ව්‍යාපාරයේ ප්‍රාග්ධනය ගණනය කර දක්වන්න. (ලකුණු 02)

i. 04/01 අයිතිකරු රු. 50,000 ක් අතිරේක ප්‍රාග්ධනයක් ලෙස යෙදවීම.

ii. 04/02 බැංකු ණය ගෙව්වා රු. 50,000

iii. 04/13 අත්පිට විකුණුම් රු. 75,000

iv. 04/24 ණය හිමියන්ට ගෙව්වා රු. 40,000

v. 04/25 පිරිවැය රු. 80,000 ක භාණ්ඩ රු. 100,000 කට විකිණීම.

අවශ්‍ය වන්නේ,

❖ ඉහත දී ඇති තොරතුරු ආරම්භ ශේෂ ද සමග ගිණුම්කරන සමීකරණයට ඇතුළත් කරන්න.

( ලකුණු 03)

( මුළු ලකුණු 10 )

06. ජානකගේ ව්‍යාපාරයේ අප්‍රේල් මාසයේදී සිදු වූ ගණුදෙනු ගිණුම් සමීකරණයට බලපා ඇති ආකාරය පහත දැක්වේ.

| දිනය | වත්කම් | | හිමිකම් + වගකීම් | | |
|---|---|---|---|---|---|
| | තොගය | මුදල් | ප්‍රාග්ධනය | ණය හිමියෝ | බැංකු ණය |
| 04/03 | | +200,000 | +200,000 | | |
| 04/08 | +50,000 | | | +50,000 | |
| 04/12 | | +150,000 | | | +150,000 |
| 04/23 | | - 50,000 | -50,000 | | |
| 04/28 | -250,000 | +300,000 | +50,000 | | |

අවශ්‍ය වන්නේ,

❖ එක් එක් ගණුදෙනුව ලියා දක්වන්න ( ලකුණු 05 )

ii පහත ගණුදෙනුවල ද්විත්ව බලපෑම ලියා දක්වන්න

i ප්‍රාග්ධනය යෙදවීම

ii බඩු තොගයක් මිලට ගැනීම

iii බැංකු ණය ගැනීම

iv විකුණුම් ආදායම් ලැබීම

v මුදල් ගැනිලි

vi ණයහිමියන්ට මුදල් ගෙවීම

vii ලී බඩු මිලට ගැනීම

viii යන්ත්‍රයක් විකිණීම

ix වැටුප් ගෙවීම

x විදුලි බිල ගෙවීම

( ලකුණු 05 )

( මුළු ලකුණු 10 )

07. රෝහණගේ ව්‍යාපාරයේ 2015 මාර්තු මාසය තුළ සිදු වූ ගණුදෙනු පහත දක්වා ඇත.

03/01 රු. 100000 ප්‍රාග්ධනය ලෙස යෙදවීම

03/02 බඩු තොගයක් මිලට ගත්තා රු. 15000

03/03 බැංකු ණය ගැනීම රු 50 000

03/04 සේවක වැටුප් ගෙවීම රු. 6000

03/15 ආයෝජන ආදායම් රු. 15000

03/16 රු. 5000 ක මුදල් අයිතිකරුගේ පෞද්ගලික ප්‍රයෝජනයට ගැනීම

03/17 ව්‍යාපාරයේ විදුලි බිල ගෙව්වා රු. 1000

03/18 ව්‍යාපාරයේ මාසික විකුණුම් රු. 125000

03/29 ව්‍යාපාරයේ නැවත විකිණීම සඳහා රු. 15 000 ක භාණ්ඩ තොගයක් මිලට ගත්තා

03/30 බැංකු ණය රු.20000 ක් පියවීම

අවශ්‍ය වන්නේ

❖ ඔබ විසින් ඉහත ගණුදෙනු ගිණුම්ගත කරන්න ( ලකුණු 10 )